1st Place Winner
National Productivity
Award 2020

ISO 9001
ISO/IEC 17021
QMS-001-01

# ප්‍රධාන ලේකම් කාර්යාලය - දකුණු පළාත
# பிரதான செயலாளர் அலுவலகம் – தென் மாகாணம்
# CHIEF SECRETARIAT - SOUTHERN PROVINCE

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My Ref. | CSS/2/20/II | ඔබේ අංකය<br>உனது இல<br>Your Ref. | | දිනය<br>திகதி<br>Date | 2023.02.16 |

ආණ්ඩුකාර ලේකම්, ආණ්ඩුකාර ලේකම් කාර්යාලය,
සභා ලේකම්, සභා ලේකම් කාර්යාලය,
ලේකම්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
සියළුම අමාත්‍යාංශ ලේකම්වරු/ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන, මුදල්, ඉංජිනේරු සේවා, සැලසුම්),
සියළුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
ව්‍යවස්ථාපිත ආයතන ප්‍රධානීන්,
දකුණු පළාත.

**<u>දකුණු පළාත් සභාවේ පුරප්පාඩුව පවතින අත්‍යාවශ්‍ය රියදුරු තනතුරු සඳහා නිලධාරීන් බඳවා ගැනීම</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් මාගේ සමාංක හා 2023.01.13 දිනැති ලිපිය හා බැඳේ.

02. එමඟින්, ඔබ ආයතනයෙහි සේවයේ නියුතු රියදුරු තනතුරෙහි සේවයේ යෙදීමට හැකියාවක් සහ කැමැත්තක් දක්වන ප්‍රාථමික සේවා ශ්‍රේණියේ නිලධාරීන්ගේ තොරතුරු කැඳවන ලද අතර, ඔවුන්ගේ සුදුසුකම් පරීක්ෂා කිරීමට තීරණය කර ඇත.

03. එකී ඉල්ලීම් අතර අමාත්‍යාංශ ලේකම්ගේ/ දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය සහිතව යොමු කර ඇති ඉල්ලීම් මෙන්ම ඒ යටතේ පවතින අනෙකුත් ආයතනයන් මඟින් හා පෞද්ගලිකව ඉදිරිපත් කර ඇති ඉල්ලීම් ද පවතී. එම සියලුම නිලධාරීන්ගේ තොරතුරු අපගේ වෙබ් අඩවියේ පළකර ඇත.

04. ඒ අනුව, ඔබ අමාත්‍යාංශයට/ දෙපාර්තමේන්තුවට අයත් එකී සියලුම නිලධාරීන් සම්බන්ධ තොරතුරු මේ සමඟ අමුණා ඇති අයදුම්පත ප්‍රකාරව සම්පූර්ණ කර, 2023.02.28 දිනට පෙර මා වෙත යොමු කරන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි. (මෙම අයදුම්පත අපගේ නිල වෙබ් අඩවිය වන http://www.cs.sp.gov.lk යන වෙබ් ලිපිනය මඟින් ද ලබා ගත හැක.)

05. එමෙන්ම, සියලුම නිලධාරීන්ගේ අයදුම්පත්, පෞද්ගලික ලිපි ගොනුව පරීක්ෂා කර බලා ආයතන ප්‍රධානියා විසින් සම්පූර්ණ කළ යුතුය.

06. තවද, මේ සම්බන්ධයෙන් ඔබ අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව යටතේ පවතින සියලුම ආයතන හා නිලධාරීන් දැනුවත් කරන මෙන් වැඩිදුරටත් ඉල්ලා සිටිමි.

ආර්.එච්.කමල් රණසිංහ,
නියෝජ්‍ය ප්‍රධාන ලේකම්(පිරිස් හා පුහුණු),
ප්‍රධාන ලේකම් වෙනුවට,
දකුණු පළාත.